# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ දර්ශනය

**බෞද්ධ චින්තාවේ සංවර්ධනය BUPH – 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

01. විනය සම්බන්ධ බුද්ධකාලීන ශාසනික ගැටලු නිරාකරණයෙහිලා බුදුරදුන් අනුදත් ක්‍රියාමාර්ගයන්හි සර්වකාලීන වැදගත්කම පැහැදිලි කරන්න.

02. මහාසංඝික නිකායෙහි ප්‍රභවය කෙරෙහි බලපෑ ඓතිහාසික හා ධර්මමය සාධක ඉදිරිපත් කරන්න.

03. ආදි බුද්ධ වචනය සුරක්ෂිත කිරීමේ ව්‍යාපාරයක් ලෙස ථෙරවාදීන් සංවිධානය වූ අයුරු සනිදර්ශනව පෙන්වා දෙන්න.

04. බුදුදහමින් නිර්දේශිත කර්ම විපාක, පුනර්භවය සහ නිර්වාණය වැනි ඉගැන්වීම් තහවුරු කිරීම සඳහා පුද්ගලවාදීන් විසින් ඉදිරිපත් කරන ලද මතවාද ගෙනහැර දක්වන්න.

05. බාහිර ලොව පැවැත්ම පිළිබඳ සෞත්‍රාන්තික ඉගැන්වීම් ආදි බෞද්ධ චින්තනය සමග කෙතෙක්දුරට අනන්‍ය වන්නේ දැයි පරීක්ෂා කරන්න.

06. සූත්‍රාන්තයන්හි විග්‍රහ වන ප්‍රතීත්‍යසමුත්පාද මූලධර්මය මාධ්‍යමිකයන් විසින් ශූන්‍යතා සිද්ධාන්තය වශයෙන් ඉදිරිපත් කර ඇති අයුරු මූලාශ්‍රයානුසාරයෙන් විශද කරන්න.

07. සම්මත ලෝකයෙහි පැවැත්ම මෙන්ම යථාර්ථය ද ප්‍රකට කරන ඉගැන්වීමක් ලෙස යෝගාචාර විඥප්තිවාදීන්ගේ ත්‍රිස්වභාව ඇගයිය හැකිදැයි විමසන්න.

08. තාන්ත්‍රික බුදුසමයේ ප්‍රභවය හා විකාසය සම්බන්ධ විද්වත් මත පිළිබඳ සමාලෝචනයක යෙදෙන්න.

09. මහායාන බුද්ධ සංකල්පයේ ප්‍රභවය කෙරෙහි ආදි බෞද්ධ මූලාශ්‍රය මෙන්ම පශ්චාද් නිකායාන්තර ඉගැන්වීම් ද බලපෑ අයුරු තහවුරු කරන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකකට ප්‍රමාණවත් සටහන් ලියන්න.

    i. ආර්යදේව පාදයෝ
    ii. වසුබන්ධු පාදයෝ
    iii. මූලමාධ්‍යමික කාරිකා
    iv. විඥප්තිමාත්‍රතාසිද්ධි විංශතිකා කාරිකා

************************************